## කාන්තාව, සාමය, ආරක්ෂාව න්‍යාය පත්‍රයේ වසර 25 ක් පිරීම නිමිත්තෙන්

## එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට

## කාන්තා  සාමය ගොඩනගන්නන්ගෙන් විවෘත ප්‍රකාශනයක්

**2025** ඔක්තෝම්බර් **6** වෙනිදා, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය කාන්තාවන්, සාමය හා ආරක්ෂාව **1325** යෝජනාව පිලිබඳ වාර්ෂික විවෘත විවාදය පවත්වයි.

වසර **25** කට පෙර, යුද්ධ අත්විඳපු කාන්තා අපූ, ආරක්ෂක මණ්ඩලයේ විවාද වලට සවන් දුන් ආරක්ෂක මණ්ඩලය ඉදිරියේ සංකීර්ණ යුද්ධ ගැටුම් හා ප්‍රචණ්ඩත්ව වලට ඒවා වලක්වා ගැනීමට අපගේ විසඳුම් ලබා දෙමින් එහා ක්‍රියාත්මක වනලෙස ඉල්ලා සිටියෙමු.

ඔවුන් කාන්තාව සාමය හා ආරක්ෂාව පිලිබඳ **1325** යෝජනාව සම්මත කරගන්නා ලදී.

නමුත් එම වචන කොලවලට පමනක් සීමාවිය. වසර **25** කට පසු අපි අවි තරඟයකට, සිවිල් සමාජ අවකාශ හැකිලෙමින් පවතින, දේශගුණික විපර්යාස, නව නවත් යුද්ධ ගැටුම්, බලහත්කාරයෙන් අත්පත්කරගැනීම් සහ ජන සංහාර වලට මුහුණ දෙමින් සිටී.

අද අපි ප්‍රකාශයන් නිකුත් නොකරමු. ඒ වෙනුවට, අපි මෙම වසර **25** පුරාවටම ආරක්ෂක මණ්ඩලය ඉදිරියේ පෙනී සිටි ඔවුන් නියෝජනය කරන මිලියන ගණනක් ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරන ලද අතර ඔවුන් වෙනුවෙන් කතා කළ ඔවුන්ගේ පණිවිඩ ප්‍රතිරාවය කරමින් සාමය ගොඩනගන කාන්තා ප්‍රජාවට ගෞරව කරනවා,....[i]

**කාන්තාව, සාමය, ආරක්ෂාව න්‍යාය පත්‍රයේ වසර 25 ක් පිරිම නිමිත්තෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට කාන්තා සාමය ගොඩනගන්නන්ගෙන් විවෘත ප්‍රකාශනයක්**

# ප්‍රකාශය

*වසර 25ක් පුරා, අපි අපගේ යථාර්ථයන් බෙදා ගත්තෙමු:*

මගේ පුතා රණබිමේ අතුරුදහන්වූදා යුද්ධය මගේ ගෙපිළට පැමිණියා මම මෙවැනි යුද්ධය නවත්වන්න උත්සහ කරන අන් මවුවරුන් සමග සම්බන්ධවුනා.

අපේ කන්ඩායම ඒ කල දමිළ කොටි සංවිධානය පාලනය කල ප්‍රදේශයට ගොස් එම තරුණියන්ගේ ප්‍රශ්න තේරුම් ගැනීමට උත්සහ කලෙමු. ඒ පැති වල කාන්තාවන් සමග වැඩ කිරීමෙන් අත්‍යවශ්‍ය විශ්වාසය ගොනගා ගත්තෙමු.

අපි, "සියලූ දෙනාගේම ජීවත්වීමේ අයිතිය" වෙනුවෙන් පෙනී සිටියෙමු.

නමුත් <u>අපගේ කාර්‍යයන් මත</u> ගොඩනැගුනු නිල වැඩපිළිවෙල අපව මග හැරියාය.[ii]

සෑම විටම ඉහළ මට්ටමේ සාකච්ඡා කාන්තාවන්ගේ හඬ සහ අත්දැකීම් ගනනට ගත්තේ නැත. [iii]

**1325** යෝජනාවට වසර **25** ක් ගතවුන කල, කාන්තා සහභාගීත්වය නිරායාසයෙන් වන්නක් මිස පසු සිතුවිල්ලක් නොවිය යුතුය.

ඉටු නොවන කැපවීම් හුදෙක් වචන පමණක් වන අතර සාමය ගොඩනැගීමට දායක නොවේ. [iv]

**ඔබ බලා සිටින්නේ කුමකටද? [v]**

*අපි දුක බෙදාගත්තා:*

හොඳ අනාගතයක් පිළිබඳ මගේ සිහිනය කෙටි විය. මගේ ගමේ විශ්වවිද්‍යාලයට යන පළමු පුද්ගලයා වෙන්න මම අධිෂ්ඨාන කර ගත්තා. නමුත් ලෝඩ්ස් රෙසිස්ටන්ස් හමුදාව තවත් ගැහැනු ළමයින් සියයකට වැඩි පිරිසක් සමග මාව පැහැරගෙන ගියා.

මම අහිංසක තරුණියක්, එල්. ආර්.ඒ අණදෙන නිලධාරියෙකු විසින් නැවත නැවතත් දූෂණය වූ.

මට බේරෙන්න අවස්ථාවක් ලැබුණා, විශ්වවිද්‍යාලයට යන්න වාසනාව ලැබුණා. නමුත් බොහෝ ගැහැණු ළමයින්ට නොහැකි වුනා මක්නිසාද යත් ඔවුන් අපයෝජනයට ලක්වීම නිසා ඔවුනට දාව උපත ලැබූ ළදරුවන් සිටිය බැවින්.

මම මගේම කතාව කීවෙමි, නමුත් ඔබ නොඇසූ කථා දහස් ගණයකි. මම මෙතනට ආවේ මේ සම්බන්ධව ඔබ ක්‍රියාත්මක වෙයි කියලා බලාපොරොත්තුවෙන් ඉන්න ළමයි ගැන ඔබට මතක් කරලා දෙන්න.[vi]

**ඔබ බලා සිටින්නේ කුමකටද?**

ලිංගික ප්‍රචණ්ඩත්වය වධහිංසා පැමිණවීමට සහ ත්‍රස්තවාදයට ආයුධයකි. – බොහෝ වින්දිතයින්ට සේවාවන්, ආරක්පාව, පිළිගැනීමක් හෝ යුක්තිය නොලැබෙනු ඇත.[vii]

**ඉටු නොවන කැපවීම් හුදෙක් වචන පමණකි.**

**ඔබ බලා සිටින්නේ කුමකටද?**
*අපි කිව්වා:*

රජයේ සහභාගිත්වයක් නොමැති විට, අපි ඉදිරියෙන් සිටියා ආධාර සහ සේවා සපයන්න ජාත්‍යන්තර සංවිධානවලට පවා ළගාවිය නොහැකි.[viii]

අන්තවාදි ප්‍රචණ්ඩත්වයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ ප්‍රදේශවල, කිසිවෙකු තලේබාන්වරුන්ට එරෙහිව නැගී සිටීමට එඩිතර නොවිය. ඒ අවශ්‍යතාවය මත, මම ඔවුන්ගේ නායකයින් සමඟ සංවාදයක් පැවැත්වූවෙමි. [ix]

ආරක්ෂාවකින් තොරව සහ සුළු සම්පත් වලින් අපි සාමය ගෙන ඒමට දිගටම වැඩ කරනවා. අපි තරුණයින් සංවේදී කරනවා ආයුධ සන්නද්ධ කණ්ඩායම් වලින් බැහැර කිරීම සඳහා.[x]

අපි නිරායුධ සිවිල් වැසියන් වෙනුවෙන් කතා කරනවා, ඉවසීම, සමාව දීම වැනි සංහිඳියාවේ මූලික මූලධර්ම මත ප්‍රායෝගික විසඳුම් ගෙන එන්න.[xi]

අපිට පුළුවන් වෙනත් ක්‍රියාකරුවන්ට නොහැකි ආකාරයට ස්ථානවලට යන්න, දේවල් කියන්න, සම්බන්ධ වෙන්න සහ විශ්වාසය ගොඩනගන්න.

අපි කාන්තාවන්ම මූලික කරන්නේ <u>නැහැ</u>.

නමුත් කාන්තාවන් ගැන කථා කිරීමේදී, ඔවුන්ට මනා දැක්මක්, ධෛර්යක් සහ හැකියාවක් තියෙනවා ඉතා භයානක වැඩවල යෙදීමට. [xii]

අපි, අත්විඳින සහ දැක ඇති බිහිසුණු දුක් ගැහැටවලින් සාමය ගොඩනගන්නන් බවට පරිවර්තනය වූ අය. [xiii]

එහෙත් ගැටුම් සහ අන්තවාදි ප්‍රචණ්ඩත්වය වැලක්වීමේ ප්‍රයත්නයන්හිදී අපි විශාල වශයෙන් අඩුවෙන් නියෝජනය වී සිටින්නෙමු. [xiv]

**ඉටු නොවන කැපවීම් හුදෙක් වචන පමණකි.**

**ඔබ බලා සිටින්නේ කුමකටද?**

*අපි ඔබට අනතුරු ඇඟෙව්වා:*

කල්පවත්නා සාමයක් ඇති කළ හැක්කේ කාන්තාවන් පිරිමින් සමඟ සාකච්ඡා මේසයේ වාඩි වූ විට පමණි.[xv]

තලෙයිබාන් සංවිධානය ප්‍රසිද්ධියේ කතා කරන කාන්තාවන් හතුරන් ලෙස සලකන්නේ ඔවුන් තලෙයිබාන් සංවිධානය ඇෆ්ගනිස්ථාන ජනතාවට කරන හිංසනයේ බරපතලකම හෙළිදරව් කරන නිසා. [xvi]

අපි මේක පිරිමින්ට විතරක් බාර දුන්නොත්, පරාජය නොවන ඊශ්‍රායල ජෙනරාල්වරු සහ පලස්තීනුවන් හමුවේ අපට සාකච්ඡා කරන්න ඉඩක් ලැබෙන්නේ නැහැ. [xvii]

ඇතුළත් කිරීම සඳහා අපේ ඉල්ලීම් උපයෝගී කරගන්න.

සාම සාකච්ඡා වලට ආයුධ පාවිච්චි කිරීම සහ ප්‍රචණ්ඩත්වයෙන් තර්ජනය කිරීම එකම ප්‍රවේශය විය යුත්තේ ඇයි?

ඔබ සාමය අත්පත් කරගැනීම ගැන සැලකිලිමත් නම්, රජයන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විදිහට, සාම ක්‍රියාකරුවන්ට ගරු කරමින් සහ ඔවුන්ව යොමු කරවා ගන්න.

අපි ජීවත් වෙන්නේ සිහින ලෝකයක නොවේ. අපේ යුද්ධ සංකීර්ණ සහ බහුවිධ ය. අපගේ සාම ක්‍රියාදාමයන් එම යථාර්ථය තුළ මුල් බැස ගත යුතුය.[xviii]

නමුත් ඉටු නොවන කැපවීම් හුදෙක් වචන පමණකි.

**ඔබ බලා සිටින්නේ කුමකටද?**

*අපි ඔබට පැහැදිලි කළා:*

කාන්තාවන් සංස්කෘතියෙන් නොව බලයෙන් බැහැර වේ.

සියලුම ගැටළු කාන්තා ගැටළු වේ.[xix]

සාමය යනු යුද්ධය නිමා කිරීම පමණක් නොව, ගැටුම් වලට මූලික වන හේතූන් වලට සාමූහිකව විසඳුම් සෙවීම සහ අපේ සමාජයේ හමුදා පාලනය ඉවත් කිරීමයි.[xx]

එදිනෙදා ජීවිතයේදී අප සාමය ගැන කාන්තාවන් හා පිරිමින් සමඟ කතා කරන විට, එයින් අදහස් වන්නේ වෙනස්කම් පිළිගැනීම, පොලිසියෙන් හොඳින් සැලකීම, රැකියාව, සෞඛ්‍යය, කාන්තාවන්ට ස්ත්‍රී දූෂණ අවදානමෙන් මිදී නිදහසේ ඇවිදීමට ඇති හැකියාව, තර්ජනයට ලක් නොවී රටේ තීරණ ගැනීමට සහභාගී වීම, බඳවා ගැනීමේ බියකින් තොරව ළමයි සෙල්ලම් කිරීම සහ ඉගෙනීම, ආදරය කරන කෙනෙකු අහිමි වේ යැයි බියෙන් තොරව සිටීම යන්නයි.[xxi]

**නමුත් ඉටු නොවන කැපවීම් හුදෙක් වචන පමණකි.**

**ඔබ බලා සිටින්නේ කුමකටද?**

ඔබ වාඩි වී සිටින විවෘත කවය, ප්‍රචණ්ඩත්වයේ චක්‍රය බිඳ දමමින් යුද්දයෙන් ඈත් වූ පැහැදිලි මාවතක් සංකේතවත් කරයි.[xxii]

ඔබ නියෝජනය කරන අතිවිශාල බලය ඉදිරියේ, එම බලය කෙතරම් භයානක විය හැකිද යන්න පිළිබඳ බිහිසුණු දැනුවත්භාවයෙන්, එක්සත් ජාතීන්ගෙ ප්‍රඥාප්තියේ දක්වා ඇති ඔබේ වගකීම ඉටු කරන ලෙස අපි ඉල්ලා සිටිමු.[xxiii]

ලෝක සාමය පවත්වාගෙන යාමේ කාර්යය "අපි එක්සත් ජාතීන්ගේ ජනතාව" සමඟ හවුල් වීමෙන් පහසු වනු ඇත.

**1325** අද්විතීයයි.

ශ්‍රී ලංකාවේ සිට කොලොම්බියාව දක්වා, ලයිබීරියාවේ සිට අචේ දක්වා මිනිසුන් සහය දක්වන වෙනත් යෝජනා මොනවාද?[xxiv]

නමුත් ඉටු නොවන කැපවීම් හුදෙක් වචන පමණකි.

**ඔබ බලා සිටින්නේ කුමකටද?**

*අපි නැවතත් ඔබට කියන්නෙමු:*

ඔබට අපව අවශ්‍යයි, මොකද, අපි කාන්තාවන් වුනත්, අපේ පැවැත්ම එකිනෙකට පරස්පරයි. අපි කතා කරනවා-වෙඩි තියන්නේ නැහැ.

අපි මේසයේ එකම පැත්තක එකට වාඩි වී අපගේ ගැටලු සහිත ඉතිහාසය දෙස බැලීමට කැමැත්තෙමු, -ගෞරවයෙන් සහ අන්‍යෝන්‍ය වශයෙන්- අපි එකට නැගිට අපගේ එකම අරමුණ ළඟා කරගන්නා තුරු සිටිමු.[xxv]

**ඔබ අප සමඟ වැඩ කිරීමට කැමතිද?**[xxvi]

ඉටු නොවන කැපවීම් හුදෙක් වචන පමණකි.

**ඔබ බලා සිටින්නේ කුමකටද?**

**ඔබ බලා සිටින්නේ කුමකටද?**

---

ආරක්ෂක මණ්ඩලය ඉදිරියේ මෙම කාන්තාවන්ගේ ප්‍රබල වචන වලට ඉන්ටර්නැෂනල් සිවිල් සොසයිටි ඇක්ෂන් නෙට්වර්ක් (ICAN) ස්තූති කරයි, ඔවුන්ගේ අදහස් උපයෝගී කර ගනිමින් මෙම ප්‍රකාශනය නිර්මාණය කරන ලදී.

*මහ අබුදයේ ෂමාස්,ග්‍රේස් අකාලෝ,හම්සතු අලමින්, විසාකා ධර්මදාස, බිනෙතා දියොප්, වජ්මා ප්‍රෝ, ටෙරි ග්‍රීන්බලාට්, අහීර් හජ්ඉබ්‍රහිම්, රීටා ලොපිඩියා, ජුලියානා ලූසෙන්ජේ, අමීනා මෙගර්බි, චාරෝ මිනාස් රොජාස්, යානා මොහොමඩ්, සාරා නඩර්, ඉයුජින් පීසා ලොපස්, මොසරත් කදීම්, සහ රෝසා එමලියා සලමන්කා.*

**පහත සඳහන් පුද්ගලයන් සහ සංවිධාන මෙම ප්‍රකාශ සාඩම්බරයෙන් අනුමත කරති (<u>මෙහි</u> ඔබේ නම ඇතුළත් කරන්න):**

සංවිධාන
- Abductees' Mothers Association
- Afghan Women Network International (AWNI)
- Association of War Affected Women (AWAW)
- Advocacy for Women in Peace and Security Africa (AWAPSA)
- Center for Civil Society and Democracy (CCSD)
- Coalition for Action on 1325 (COACT)
- Coast Education Centre (COEC)
- Corporación de Investigación y Acción Social y Económica
- DemoS
- Empatiku Foundation
- FARAGEER (Women Led Global Forum for Afghanistan)
- Justice, Human Rights, and Gender Civil Association
- International Civil Society Action Network (ICAN)
- Kitgum Women Peace Initiative (KIWEPI)
- Legal Action Worldwide
- PAIMAN Alumni Trust
- Pathways for Women's Empowerment and Development / Integrated Agricultural Training Center (PaWED-IATC)
- Philippine Center for Islam and Democracy
- Reach Out Cameroon
- Regional Coalition for Women Human Rights Defenders in South West Asia and North Africa (WHRDMENA)
- Tunisian League of Human Rights
- Urgent Action Fund for Feminist Activism
- Union de l’action Féminine (UAF)
- Wi'am - The Palestinian Conflict Transformation Center
- WO=MEN
- Women for Justice Foundation (WJF)
- Women Living Under Muslim Laws (WLUML)
- Women for Peace and Participation
- Women Relief Aid

- Women and Children Research and Advocacy Network (WCRAN)
- Women Education and Development Organization of Liberia (WEDOL)
- Women Human Rights Defenders International Coalition (WHRDIC)
- Women's Advocacy Committee (WAC)
- Women's Alliance for Security Leadership (WASL)
- Women's Center for Guidance and Legal Awareness (WCGLA)
- Women's Initiative for Gender Justice
- Women's International Peace Centre
- Women's Rehabilitation Centre (WOREC)

පුද්ගලයින්

- Kawther Alkholy
- Antelak Almutawakel
- Khedija Arfaoui
- Sarah Arumugam
- Hafida Benchehida
- Charlotte Bunch
- Visaka Dharmadasa
- Rodolfo Domínguez
- Omam Esther
- Cerue Konah Garlo
- Quhramaana Kakar
- Ashima Kaul
- Mary Akrami
- Mira Kusumarini
- Muna Luqman
- Bernedette Muthien
- Ahlem Nasraoui
- Neelam Raina
- Amina Rasul
- Cynthia Rothschild
- Mariyam Shakeela
- Nicoline Wazeh

---

[i] ආරක්ෂක මණ්ඩලය හමුවේ පෙනී සිටි පහත සඳහන් කාන්තාවන්ගේ බලවත් හඬට ඉන්ටර් නැෂනල් සිවිල් සොසයිටි නෙට්වර්ක් කෘතඥතාවය දක්වයි. සනම් නරාගි ඇන්ඩ්‍රලිනි, මෙලින්ඩා හොල්ම්ස්, සහ ඉසබෙලා කරිබ්ජනිඅන් යන අය ඔවුන්ගේ අදහස් උපයෝගී කර ගනිමින් මෙම ප්‍රකාශනය නිර්මාණය කරන ලදි. මෙම ප්‍රකාශයේ යාවත්කාලීන කළ අනුමත කිරීම් ලැයිස්තුව හා එයට අදාළ අන්තර්ගතය මෙතැනින් ලබාගත හැක:https://icanpeacework.org/2025/10/open-statement-to-the-unsc-from-women-peacebuilders/.

[ii] Visaka Dharmadasa, Sri Lanka, 2010

[iii] Eugenia Piza-Lopez, Costa Rica, 2000

[iv] Rita Lopidia, South Sudan, 2016

[v] Bineta Diop, Senegal, 2012

[vi] Grace Akallo, Uganda, 2009

[vii] Amina Megheirbi, Libya, 2012

[viii] Yanar Mohammed, Iraq, 2015

---

[ix] Mossarat Qadeem, Pakistan, 2009
[x] Julienne Lusenge, Democratic Republic of the Congo, 2015
[xi] Asha Hagi Elmi Amin, Somalia, 2009
[xii] Mossarat Qadeem, Pakistan, 2009
[xiii] Hamsatu Allamin, Nigeria, 2015
[xiv] Yanar Mohammed, Iraq, 2015
[xv] Wazhma Frogh, Afghanistan, 2017
[xvi] Zahra Nader, Afghanistan, 2022
[xvii] Maha Abu-Dayeh Shammas, Palestine, 2002
[xviii] Mossarat Qadeem, Pakistan, 2009
[xix] Visaka Dharmadasa, Sri Lanka, 2010
[xx] Charo Mina-Rojas, Colombia, 2017
[xxi] Rosa Emilia Salamanca, Colombia, 2019
[xxii] Abir Haj Ibrahim, Syria, 2024
[xxiii] Terry Greenblatt, Israel, 2002
[xxiv] Visaka Dharmadasa, Sri Lanka, 2010
[xxv] Terry Greenblatt, Israel, 2002
[xxvi] Visaka Dharmadasa, Sri Lanka, 2010